“මෙය වසර හැත්තෑවකට පෙර අපා ගින්නට විසිකරන ලද ගලකි. දැන් එය අපා ගින්නට එහි පතුළ තෙක් වැටෙමින් පවතී. නුඹලා සවන් දුන්නේ එය වැටෙන හඬට ය.” යැයි පැවසුහ

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "අපි අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) සමග සිටියෙමු. එවිට යමක් වැටෙන හඬක් ඇසිණ.
එවිට එතුමාණෝ: ‘ඒ කුමක්දැයි නුඹලා දන්නෙහු ද?” යැයි විමසූහ. අපි: “මැනවින් දන්නා අල්ලාහ් හා ඔහුගේ දූතයාණන්’ වේ යැයි පැවසුවෙමු. එතුමාණෝ: “මෙය වසර හැත්තෑවකට පෙර අපා ගින්නට විසිකරන ලද ගලකි. දැන් එය අපා ගින්නට එහි පතුළ තෙක් වැටෙමින් පවතී. නුඹලා සවන් දුන්නේ එය වැටෙන හඬට ය.” යැයි පැවසුහ. [صحيح] [رواه مسلم]

ශරීරයක් බිම ඇඳ වැටුනාක් මෙන් කලබලකාරී හඬකට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ සවන් දුන්හ. තමන් හමුවේ සිටින සහගාමීන්ගෙන් එම හඬ පිළිබඳ විමසා සිටියහ. එවිට ඔවුහු: "ඒ ගැන අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් මැනවින් දනී" යයි පවසා සිටියෝ ය. එවිට එතුමාණෝ ඔවුනට මෙසේ පැවසූහ: "සැබැවින්ම ඔබ සවන් දුන් එම හඬ වසර හැත්තෑවකට පෙර අපා ගින්නට හෙළනු ලැබ, දැන් එහි පතුළට වැටුණු ගලකි. ඔබට දැන් ඇසුණේ එම හඩ ය."

https://sunnah.global/hadeeth/si/show/3370